**විද්‍යා පශ්චාත් උපාධි ආයතනය - 2023**

**--------------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මතය

විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්ති වලට අදාල තොරතුරු ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන් වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමග සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව, මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

ආයතනයේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය නොකළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, ආයතනය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය ආයතනය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා ආයතනයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.
ආයතනයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, ආයතනයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනා ගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව් කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව්කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ආයතනයේ කාර්යයන් අඛණ්ඩව ඇගැයීමට හැකි වන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති,

පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව,

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ ආයතනයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ආයතනය ක්‍රියා කර ඇති බව,
- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,
- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීති, රීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිත කර ඇති බව.

**1.4 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම.**

| | නීති, රීති හා රෙගුලාසි යනාදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | 2018 නොවැම්බර් 26 දිනැති අංක 15/2018 දරන විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛය | රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තුමේන්තුවේ හා මහා භාණ්ඩාගාරයේ අනුමැතියකින් තොරව 2020 අගෝස්තු සිට 2023 දෙසැම්බර් 31 වන දින දක්වා කාලය තුළ සේවක අග්‍රහාර රක්ෂණ යෝජනා ක්‍රමයක් සඳහා අග්‍රහාර දායකය වශයෙන් රු.441,600 ක් ජාතික රක්ෂණ භාර අරමුදල වෙත ගෙවා තිබුණි. | කාර්යය මණ්ඩල සුභසාධනය යටතේ අදාල වර්ෂයන්හි අයවැය ලේඛනයේ ඇතුලත් කිරීමට කටයුතු කර ඇති බව. | චක්‍රලේඛ උපදෙස් අනුව කටයුතු කළ යුතුය. |
| (ආ) | 2018 මැයි 18 දිනැති අංක UGC/L/2020 දරන විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ ලිපිය | සියලුම පශ්චාත් උපාධි ආයතනවල කළමනාකරණ මණ්ඩලයේ සම්පූර්ණ සාමාජිකත්වය උපරිම සාමාජිකයින් 11 දෙනෙකුට සීමා කළයුතු බව දක්වා තිබුණද, ඊට පටහැනිව සාමාජිකයින් 20 දෙනෙකුගෙන් සමන්විත කළමනාකරණ මණ්ඩලයක් පත් කර තිබුණි. මේ හේතුවෙන් 2019 ජනවාරි සිට 2023 දෙසැම්බර් 31 දින දක්වා කාලපරිච්ඡේදය තුළ කළමනාකරණ මණ්ඩලයේ රැස්වීම් වාර 29ක් සඳහා අමතර සාමාජිකයින් වෙනුවෙන් එකතුව රු.1,109,920 ක වියදමක් සහභාගීත්ව දීමනා වෙනුවෙන් වැඩියෙන් වැය කර තිබුණි. | කළමනාකරණ මණ්ඩල සංයුතිය අඩුකිරීමට ඉදිරියේදී සළකා බලනු ලබන බව. | චක්‍රලේඛ උපදෙස් අනුව කටයුතු කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.15,467,962 ක ඌනතාවයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.238,811,062 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.254,279,024 ක පිරිහිමක් නිරීක්ෂණය විය. මෙම පිරිහිමට වර්ෂය තුළ විදේශ විනිමය හුවමාරු අලාභය රු.41,494,616 ක් වීම, අභ්‍යන්තර මෙහෙයුම් ආදායම් රු.24,486,980 කින් අඩුවීම, රාජ්‍ය ප්‍රදාන නොලැබී යාම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2017 වර්ෂයේ සිට 2022 වර්ෂය දක්වා කාලයට අදාළව සිසුන් 1790 දෙනෙකුගෙන් අයවිය යුතු රු.28,752,500 ක පාඨමාලා ගාස්තු සමාලෝචිත වර්ෂය අවසන් දින වන විටත් අය කර නොතිබුණි. | සියළුම සිසුන් වෙත සිහි කැඳවීමේ ලිපි යොමුකර ඇති අතර ඉදිරියේදී මෙම මුදල් අයකර ගැනීමට කටයුතු කරනු ලබන බව. | පාඨමාලා ගාස්තු අය කිරීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | ආයෝජන කල් පිරීමේදී මිල ගණන් කැඳවා ඉහළම පොළී අනුපාතයක් යටතේ නැවත ආයෝජනය කළ යුතු වුවත්, එවැනි විචක්ෂණශීලීත්වයකින් තොරව කටයුතු කිරීම හා ඉහළම පොළී අනුපාතයක් ලබා දෙන මහජන බැංකුව සමඟ ගනුදෙනු නතර කිරීමට ආයතනය විසින් තීරණයකර තිබුණි. ඒ අනුව 2022 ජනවාරි සිට 2023 ජුනි දක්වා වූ කාල පරිච්ඡේදයට අදාළව ස්ථාවර තැන්පතු 17 ක් සඳහා එකතුව රු.6,285,474 ක පොළී ආදායමක් අහිමි වී තිබුණි. | ආයතනයේ මූල්‍ය වංචාවට අදාල නඩුවේ සාක්ෂි වශයෙන් ඉදිරිපත් කිරීමට අවශ්‍යවේ යැයි විශ්වාසයෙන් මහජන බැංකුවේ පවත්වාගෙන යන ස්ථාවර තැන්පතු ගිණුම් 06 ක් නැවත එම බැංකුවේම ආයෝජනය කිරීමට කටයුතු කර ඇති බව හා අනෙකුත් රාජ්‍ය බැංකුවලින් මිල ගණන් කැඳවා ඉහලම පොළී අනුපාතය යටතේ අදාල ආයෝජනයන් සිදු කිරීමට කටයුතු කර ඇති බව. | විචක්ෂණශීලීව කටයුතු කර ආයෝජනය මඟින් උපරිම ප්‍රතිලාභ ලබා ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | 2021 වර්ෂයේ හා සමාලෝචිත වර්ෂයේ ඉලක්කගත ලියාපදිංචි සිසුන් ප්‍රමාණය පිළිවෙලින් 300 ක් හා 200 ක් වුවද, සිසුන් 97 දෙනෙකු හා සිසුන් 129 දෙනෙකු පමණක් ලියාපදිංචි වී තිබුණි. එසේම 2019 වර්ෂයේ සිට 2023 වර්ෂය දක්වා කාලපරිච්ඡේදය තුළ ලියාපදිංචි මුළු ශිෂ්‍ය සංඛ්‍යාව වූ 1588 න් 2023 වර්ෂය අවසන් වන විට ශිෂ්‍යයන් 394 ක් පාඨමාලා හැර ගොස් සිටි අතර එය ලියාපදිංචි ශිෂ්‍ය | පාඨමාලා 3 ක් පොදු වශයෙන් සිසුන් විශාල ප්‍රමාණයක් අයදුම් කරනු ලබන පාඨමාලා නොවීම හා පසුගිය කාලය තුල අනපේක්ෂිතව රටේ ඇති වූ විවිධ ව්‍යාකූලත්වයන් හේතුවෙන් නියමිත දිනට පාඨමාලා අවසන් කිරීමට නොහැකි වීම මේ සඳහා හේතුවී ඇති බව. | ශිෂ්‍ය ලියාපදිංචිය වැඩි කර ගැනීමට කටයුතු කළ යුතුය. |

සංඛ්‍යාවෙන් සියයට 25 ක් පමණ විය. සිසුන් පාඨමාලා සඳහා ලියාපදිංචිය අඩුවීමටත් පාඨමාලා හැර යාමටත් හේතු සොයා බැලීම සඳහා කළමනාකරණයේ අවධානය යොමු වී නොතිබුණි.

## 3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ආයතනය සඳහා කළමනාකරණ තොරතුරු පද්ධතියක් (MIS) සැලැසුම් කිරීම, සංවර්ධනය කිරීම, ස්ථාපනය කිරීම සහ නඩත්තු කිරීම වෙනුවෙන් රු.4,440,457 ක මුදලකට 2022 ජූනි 12 දින පෞද්ගලික ආයතනයක් සමඟ ගිවිසුම්ගතවී තිබුණි. ගිවිසුම්ගත කාලය ඉක්මවා මාස 09 කට අධික කාලයක් ගතවී තිබුණද, වාර්තාවේ දිනය දක්වාම කළමනාකරණ තොරතුරු පද්ධතියේ කටයුතු අවසන් කර නොතිබුණි. | කල් දිගු කිරීම් ලබාගැනීමට කටයුතු කරමින් පවතින අතර මේ වන විට සියළුම මොඩියුල සඳහා පද්ධති අවශ්‍යතා පිරිවිතර සකස් කර අවසන් කර ඇති බව. | ගිවිසුම්ගත කාල සීමාව තුළ කොන්ත්‍රාත් වැඩ අවසන් කළ යුතුය. |